# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1957/25 - 2016 මාර්තු මස 11 වැනි සිකුරාදා - 2016.03.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය* :.KDS/MDB/2/1/209.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : LD/05/2008/D/262.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

(5 (සෙව) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව සඳහා ඉඩම් අත්පත් කර ගැනීම)

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පලිස්පත්තුව බටහිර කෝරලේ සුළු කොට්ඨාසයේ මාබේරියතැන්න (අංක - 827) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මාබේරියතැන්න ගමේ පිහිටි මහනුවර මැනුම් අධිකාරිගේ මූලික පිඹුරු අංක මහ 6362 දරන පිඹුරේ කැබලි අංක 01 හා කැබලි අංක 02 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2.1730 ක් වූ වික්ටෝරියාවත්ත නැමැති ඉඩම :

1. කැබලි අංක 1
හිමිකම් කියන අය: රජය; *මුල් හිමිකම් කියන්නා: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව*; ප්‍රමාණය: හෙක්. 2.0832

2. කැබලි අංක 2
හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.898

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2016 මාර්තු මස 23 වැනි දින පෙ. ව. 10.00 ට මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2016 මාර්තු මස 16 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. අයිතිවාසිකම් තහවුරු කිරීම පිණිස අදාළ ඔප්පු සහ ලියකියවිලි මගේ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුයි.

ජේ. එම්. ජේ. කේ. ජයසුන්දර,
ප්‍රාදේශීය ලේකම්,
මැදදුම්බර.

2016 ජනවාරි මස 27 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

03 - 688

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය* :.KDS/MDB/4/2/1/214.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/9/2012/අයිආර්/355.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ගෝනගලතැන්න වැව ඉදි කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම)

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැදසියපත්තුව කෝරළේ සුළු කොට්ඨාසයේ බඹරගහදෙණිය (818) ග්‍රාම නිළධාරි වසමේ අඟුරුවෙල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවට මහනුවර දිස්ත්‍රික් ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද මහ 6524 හා 2015.12.14 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 සිට කැබලි අංක 09 දක්වා පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 4.3484 ක් පමණ වන ගෝනගලහේන සහ ගෝනගහ කුඹුර නැමැති ඉඩම් :

**1. කැබලි අංක 1**
ඉඩමේ නම: ගෝනගල කුඹුර; ඉඩමේ විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා : ගෝනගල පදිංචි ආර්. ඩබ්. ජී. සුන්දරා: හෙක්. 0.1270

**2. කැබලි අංක 2**
ඉඩමේ නම: ගෝනගල හේන; ඉඩමේ විස්තරය: හේන; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා : ගෝනගල පදිංචි ඩබ්. ජී. සෝමපාල: හෙක්. 0.1023

**3. කැබලි අංක 3**
ඉඩමේ නම: ගෝනගල කුඹුර; ඉඩමේ විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා : අංක 114-බී, බඹරගහදෙණිය, මැදමහනුවර පදිංචි ඩබ්. ජී. සේමපාල: හෙක්. 0.3699

**4. කැබලි අංක 4**
ඉඩමේ නම: ගෝනගල හේන; ඉඩමේ විස්තරය: හේන; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා : කෝපිකොලනිය, බඹරගහදෙණිය පදිංචි ආර්. එන්. පී. තිලකරත්න: හෙක්. 0.3018

**5. කැබලි අංක 5**
ඉඩමේ නම: ගෝනගල කුඹුර; ඉඩමේ විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: කෝපිකොලනිය, බඹරගහදෙණිය පදිංචි ආර්. එන්. පී. තිලකරත්න: හෙක්. 0.4561

**6. කැබලි අංක 6**
ඉඩමේ නම: ගෝනගල හේන; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් සහ අවුරුදු 10 පැරණි ගම්මිරිස් වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: කෝපිකොලනිය, බඹරගහදෙණිය පදිංචි ආර්. එන්. පී. තිලකරත්න: හෙක්. 0.6091

**7. කැබලි අංක 7**
ඉඩමේ නම: ගෝනගල හේන; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් සහ අවුරුදු 10 පැරණි ගම්මිරිස් වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: කෝපිකොලනිය, බඹරගහදෙණිය පදිංචි ඒ. ජී. පී. මුතුබණ්ඩා: හෙක්. 0.3032

**8. කැබලි අංක 8**
ඉඩමේ නම: ගෝනගල කුඹුර; ඉඩමේ විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: කෝපිකොලනිය, බඹරගහදෙණිය , මැදමහනුවර පදිංචි ආර්. එම්. පී. ගුණපාල: හෙක්. 0.4302

**9. කැබලි අංක 9**
ඉඩමේ නම: ගෝනගල කුඹුර; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් සහ අවුරුදු 10 පැරණි ගම්මිරිස් වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: කෝපිකොලනිය, බඹරගහදෙණිය පදිංචි ආර්. එම්. පී. ගුණපාල: හෙක්. 1.6488

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවළුන් 2016 මැයි මස 18 වැනි දින පෙ. ව. 10.00 ට මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2016 මැයි මස 11 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය

ජේ. එම්. ජේ. කේ. ජයසුන්දර,
ප්‍රාදේශීය ලේකම්,
මැදදුම්බර.

2016 පෙබරවාරි මස 12 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

03 - 689

---

ශුද්ධි පත්‍රිකාව

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* :.THI/LND/L2/ACQVI/117-1 VOL.
*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය* : 4/3/8/2012/PC/342.

තිහගොඩ ප්‍රාදේශීය ලේකම් පොරවකාර කංකානම්ගේ චමිලා නිලානි මහින්දඥාන වන මම තිහගොඩ නගර සංවර්ධනය සඳහා අත්පත් කර ගැනීමට අදාළව නිකුත් කරන ලද 2016.02.11 දිනැති අංක 1953/26 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* 1 ඒ පිටුවෙහි ප්‍රකාශයට පත් කරන ලද 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7 වන වගන්තිය යටතේ ගැසට් නිවේදනයේ සඳහන් වන්දි පරීක්ෂණ දිනය 2016.04.06 වැනි දින ලෙස සංශෝධනය කරන ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ප්‍රාදේශීය ලේකම්,
තිහගොඩ.

03-690

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.